# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*


මගේ අංකය :LAE/2018/4B
எனது இல.

ඔබේ අංකය :
உமது இல.

දිනය : 2017.11.28
திகதி

**ලේඛනගත තැපැල**

**ඉතා වැදගත්**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2018**
**රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම**

පළාත් පාලන ආයතන 93 ක් සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2017.11.27 දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් වූ කාල සීමාව "ඡන්ද විමසීමේ කාල සීමාව" ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් වේ. මෙම කාලසීමාව තුළ දී දේශපාලන පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයකු අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා ඡන්ද විමසීම පැවැත්වෙන දිස්ත්‍රික්කවල රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල හා වර්තමාන පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථාවන් අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට අයත්ය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපල භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී.

03. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ ආදී සියලුම වාහන සහ හෙලිකොප්ටර් සහ ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය මැතිවරණ අවස්ථාවල දී ද මෙම කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට